ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපනඥයින් සඳහා වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2008

**ESP 2262 -ගුරු අධ්‍යාපනඥයින් සඳහා කළමනාකරණය**

කාලය - පැය තුනයි.

---

දිනය - 2008.05.26 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30 දක්වා

---

ප්‍රශ්න හතරක් (04) පමණක් පිළිතුරු සපයන්න.

01. i. 'සංවිධාන සංස්කෘතිය' 'සංවිධාන වාතාවරණය' යන දෑ වෙන්කොට හඳුනා ගන්න.
(ලකුණු 08 යි.)

ii. සංවිධාන සංස්කෘතිය විශ්ලේෂණය කල හැකි ලක්ෂණ කවරේදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 12 යි.)

iii. 'කළමනාකරණ තීරණ ගැනීම කෙරෙහි සංවිධානයක සංස්කෘතිය බලපෑම් කරනු ඇත.' ඔබගේ සංවිධානයේ පවතින සංස්කෘතිය ගැන සැලකිලිමත් වෙමින් ඉහත දැක් වූ වාක්‍යය විභාග කරන්න.
(ලකුණු 13 යි.)

02. i. අ) ඔබගේ සංවිධානයේ සිදුවූ වෙනස්කමක් කෙටියෙන් පැහැදිලි කරන්න.
ආ) එයට කවර බලපෑම් ඇති වී ද ?
(ලකුණු 10 යි.)

ii. ඕනෑම සංවිධානයක, ඇතැම් අය වෙනස්කම් තෘප්තිමත්ව පිළිගනු අතර, වෙනත් අය ඒවාට විරුද්ධ වේ. ඔබගේ ආයතනයෙන් උදාහරණ ගෙන එම තත්වයන් පැහැදිලි කරන්න.
ඉහත සඳහන් දෙවන අවස්ථාවට ඔබ මුහුණ දෙනුයේ කෙසේ ද?
(ලකුණු 10 යි.)

iii. වෙනස්කම් ගෙන ඒම සඳහා සුදුසු ආකෘතියක් තෝරා උදාහරණ සපයමින් වෙනස්කම් හැඳින්වීම ඵලදායී සේ කල හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 13 යි.)

03. i. ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන පද්ධතියේ ව්‍යුහය සරල ලෙස පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි.)

ii. ගුරු අධ්‍යාපනයට අදාල අ) කළමනාකරණ ආ) පාරිසරික ගැටළු කවරේ ද? සුදුසු උදාහරණ දෙමින් පහදා දෙන්න.
(ලකුණු 10 යි.)

iii. එම ගැටළු විසඳීමට මෑතක දී ගන්නා ලද පියවර විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.
(ලකුණු 13 යි.)

047
UNIVERSITY OF SRI LANKA LIBRARY

04. පහත දෙන ලද මාතෘකා (3) තුනක් ගැන කෙටි සටහන් ලියන්න.

(i) උප දේශානාත්මක නායකත්වය
(ii) ශ්‍රී ලංකාවේ ගුරු කාර්ය සාධන ඇගයීම් වැඩ සටහන්
(iii) පාසල් පාදක ගුරු සංවර්ධනය
(iv) ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු සංවර්ධන වැඩ සටහන්
(v) කාර්යක්ෂම බව හා ඵලදායීතාවය

(ලකුණු 11 x 3 යි.)

05. (i) කළමනාකරුවෙකු හා නායකයකු අතර වෙනස හඳුනා ගන්න. (ලකුණු 06 යි.)

(ii) ඕනෑම නායකත්ව න්‍යායක් තෝරා, ඔබ සේවය කරන සංවිධානයේ නායකත්වය මත, එය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 14 යි.)

(iii) ඔබගේ සංවිධානයේ ඵලදායී බව සඳහා කුමන නායකත්ව ශෛලියක් සුදුසු දැයි උදාහරණ සහිතව පෙන්වන්න. (ලකුණු 13 යි.)

06. (i) ප්‍රතිපත්ති යන සංකල්පය උදාහරණ දෙමින් සරල ලෙස පැහැදිලි කරන්න.
(ලකුණු 07 යි.)

(ii) 1943 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනය ගැන ගනු ලැබුණු ප්‍රතිපත්ති තීරණ විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.
(ලකුණු 13 යි.)

(iii) 21 වන සියවසෙහි සිදුවන වෙනස්කම්වලට සාර්ථකව මුහුණ දීම සඳහා ගුරු අධ්‍යාපනයට අවශ්‍ය යෝග්‍ය විකල්ප ප්‍රතිපත්ති කවරේදැයි ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 13 යි.)

- හිමිකම් ඇවිරිණි. -